# ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තා දේශපාලන නියෝජන (2015 අගෝස්තු 17 වන දින පැවති මහ මැතිවරණයට විශේෂිතව)

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**ජේ.එච්. එම්. සසංගිකා හර්ෂණ**
**සමන්තිකා ප්‍රියදර්ශණී**

**සංක්ෂේපය**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය උපතින්ම හිමි ලිංගභේදය පදනම් කරගෙන සමාජීය හෝ සංස්කෘතික අර්ථකථන මත ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිර්මාණය වී ඇත. වසර 05කට වරක් පාර්ලිමේන්තුවට මහජන ඡන්දයෙන් නියෝජිතයින් පත් කරයි. කාන්තා දේශපාලඥවරියන් පත්වේ. 2015 මහ මැතිවරණයට විශේෂිතව ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තා දේශපාලන නියෝජන පිළිබඳව පර්යේෂණය මඟින් සිදු කර ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය කාන්තා දේශපාලන නියෝජනය සඳහා බලපානු ලබයිද යන්න මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වේ. 2015 පැවති මහ මැතිවරණය සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය කාන්තා දේශපාලන නියෝජන කෙරෙහි බලපානු ලබයිද යන්න ප්‍රධාන ගැටලුව වේ. 2015 පැවති මහ මැතිවරණයෙන් වැඩිම ඡන්ද ප්‍රමාණයක් හිමි කර ගත් කාන්තා නියෝජිතවරියන් වන පිළිවෙළින් තලතා අතුකෝරාළ, පවිත්‍ර වන්නිආරච්චි සහ චන්ද්‍රානි බණ්ඩාර යන ඇමතිවරියන් පිළිබඳව ප්‍රත්‍යෙයක අධ්‍යයනයක් කරන ලදි. අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය භාවිත කර ඇත. ගුණාත්මක දත්ත ප්‍රමාණාත්මක දත්ත භාවිත කරන ලදි. ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා නියැදිය වශයෙන් අනුරාධපුර සහ රත්නපුර දිස්ත්‍රික්කය දෙක තුළ දත්ත දායකයින් 150 සසම්භාවි නියැදුම් ක්‍රමය යටතේ ලබා ගත්හ. ද්විතික දත්ත සඳහා මැතිවරණ ප්‍රතිඵල භාවිත කළ අතර වගු/ ප්‍රස්තාර මඟින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය කාන්තා දේශපාලන නියෝජනය කෙරෙහි බලපානු ලබන්නේය යන උපන්‍යාසය තහවුරු වේ. පීතෘ මූලික ආධිපත්‍යය යටතේ බහුතර කාන්තා පිරිසක් ගෘහයට සීමා වී කටයුතු කිරීම හේතුවෙන් පුරුෂයින් සමාජීය කටයුතුවලට ප්‍රවේශවීමේ ප්‍රතිඵලයක් ලෙස පුරුෂයින් දේශපාලනයට ප්‍රවේශ වීමේ ප්‍රවණතාවය වැඩිවේ. පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය සඳහා නිශ්චිත පංගු ක්‍රමයක්(කෝටා ක්‍රමයක්) අනිවාර්ය නොවීම සහ දේශපාලනයෙහි නියුතු කාන්තාව පිළිබඳව මාධ්‍ය තුළ යහපත් ප්‍රතිරූපයක් නොතිබීම කාන්තා නියෝජනය අවම වීමට හේතුවේ. කාන්තාව සම්බන්ධව පවුල සහ සමාජය තුළ නිර්මාණය වී පවතින ඍණාත්මක ආකල්පය නැති කළ යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සහ දේශපාලන පක්ෂ ප්‍රතිපත්තිය තුළ කාන්තා නියෝජනය සඳහා නිශ්චිත පංගු ක්‍රමයක්(කෝටා ක්‍රමයක්) ඇති කළ යුතු අතර ජන මාධ්‍ය තුළින් කාන්තාව පිළිබඳව සහ ඇගේ දේශපාලන ප්‍රතිපත්ති කෙරෙහි යහපත් රූපයක් නිර්මාණය කළ යුතු අතර සහ කාන්තාව පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීමේ වැදගත්කම අවධාරණය කළ යුතුය.

මුඛ්‍ය පද : ස්ත්‍රී පුරුෂ සමාජභාවය, කාන්තාව, දේශපාලන නියෝජනය, මැතිවරණ, ඡන්දය

*1., ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය , ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*